# <u>දැන්වීමයි</u>

**පේරාදෙණිය විශ්වවිද්‍යාලය**
**පීඨ ශිෂ්‍ය නිලවරණය - 2017**

**විද්‍යා පීඨය**

1985 අංක 7 හා 1988 අංක 26 දරණ පනත්වලින් සංශෝධිත 1978 අංක 16 දරණ විශ්වවිද්‍යාල පනතේ 112 (3) වගන්තිය සමග කියවිය යුතු 135 වගන්තිය යටතේ පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ පාලක සභාව විසින් සම්පාදනය කරන ලද අතුරු ව්‍යවස්ථාව පරිදි විද්‍යා පීඨයේ 2017 වර්ෂය සඳහා ලියාපදිංචි කරනු ලබන ශිෂ්‍ය සමූහය අතරින් **පීඨ ශිෂ්‍ය සංගමයේ,**

i. සභාපති
ii. උප සභාපති
iii. ලේකම්
iv. සංස්කාරක
v. කණිෂ්ඨ භාණ්ඩාගාරික යන තනතුර සඳහා නිලධාරීන් සහ
vi. පහත සඳහන් ආකාරයට අදාළ සාමාජික සංඛ්‍යාවක් ද තෝරාගනු ලැබේ.

| | |
|---|---|
| ලියාපදිංචි සිසුන් 200 ක් හෝ ඊට අඩු සංඛ්‍යාවක් ඇති පීඨයක් සඳහා සාමාජිකයන් | 02 ක් |
| ලියාපදිංචි සිසුන් 201 ක් සිට 400 දක්වා ඇති පීඨයක් සඳහා සාමාජිකයන් | 04 ක් |
| ලියාපදිංචි සිසුන් 401 ක් සිට 600 දක්වා ඇති පීඨයක් සඳහා සාමාජිකයන් | 06 ක් |
| ලියාපදිංචි සිසුන් 600 ට වැඩි සංඛ්‍යාවක් ඇති පීඨයක් සඳහා සාමාජිකයන් | 08 ක් |

2003 අංක 1 දරණ ශිෂ්‍ය සමිති අතුරු ව්‍යවස්ථාවේ 8 වගන්තියෙහි විධිවිධාන සළසා ඇති පරිදි මෙම නිලවරණය සම්බන්ධයෙන් නිලවරණ නිලධාරී විද්‍යා පීඨයේ පීඨාධිපති වන්නේය. ඉහත තනතුරු සඳහා නිලධාරීන් තේරීම් සම්බන්ධයෙන් නාම යෝජනා 2017.06.30 වන දින ප.ව. 1.00 සිට ප.ව. 4.00 අතර කාලය තුළදී විද්‍යා පීඨ පීඨාධිපති විසින් සිය කාර්යාලයේදී භාරගනු ලැබේ.

නියමිත නාම යෝජනා හා ආකෘති පත්‍ර විද්‍යා පීඨ පීඨාධිපතිගෙන් ලබාගත යුතු අතර, පැහැදිලි අකුරින් අයදුම්පත් පිරවිය යුතුය.

අයදුම්කරු, යෝජක, ස්ථිර කරන්නා විසින් තමන් හඳුනා ගැනීම සඳහා පීඨයේ පීඨාධිපති වෙත හෝ ඔහු විසින් නම් කරනු ලබන පුද්ගලයා වෙත අනිවාර්යයෙන්ම සිය ශිෂ්‍ය වාර්තා පොත ඉදිරිපත් කළ යුතු වන්නේය. ශිෂ්‍ය වාර්තා පොතෙහි 2017/2018 වර්ෂය සඳහා නිල සටහනක් අන්තර්ගත විය යුතුවේ.

**නිලවරණය : 2017.07.13 වෙනි දින පෙ.ව. 9.00 සිට ප.ව. 4.00 දක්වා විද්‍යා පීඨයේ දී පැවැත්වෙනු ඇත.**

ඡන්ද දායකයන්ගේ නම් ලැයිස්තුවක් 2017.06.20 වන දින පෙ.ව. 9.00 සිට පීඨයේ ප්‍රධාන දැන්වීම් පුවරුවෙහි ප්‍රදර්ශනය කරනු ලැබේ. මෙම ලැයිස්තුවේ කිසියම් හෝ වැරදීම්, අත්හැරීම් ඇති නම් එබඳු අඩුපාඩුකම් සම්බන්ධයෙන් 2017.06.30 වෙනි දින හෝ ඊට පෙර පීඨාධිපති හෝ ඔහු විසින් නම් කරනු ලබන්නෙකු වෙත හෝ ලිඛිතව දැනුම්දිය යුතුවේ. 2017.06.30 වන දින ප.ව. 4.00 ට පසුව එබඳු යම් නිවැරදි කිරීම් සම්බන්ධව ඡන්දදායකයන්ගේ ඉල්ලීම් භාරගනු නොලැබේ.

පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ පාලක සභාව විසින් සම්පාදනය කරන ලද යථෝක්ත අතුරු ව්‍යවස්ථාවේ පිටපතක් ද පීඨයේ ඇති දැන්වීම් පුවරුවෙහි ප්‍රදර්ශනය කරනු ඇත.

ලේඛකාධිකාරී
පේරාදෙණිය විශ්වවිද්‍යාලය
2017.06.12

**ලේඛකාධිකාරී**
**පේරාදෙණිය විශ්වවිද්‍යාලය**
**පේරාදෙණිය.**